ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව – 3 වන මට්ටම

දෙවන අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය – 2008 / 2009

සාධාරණත්වයේ මූලධර්ම – LWU 1202

කාලය – විනාඩි 40 යි

---

දිනය: 25. 11. 2008      වේලාව: පෙ. ව. 11.00 සිට 11.40 දක්වා

---

එක් ප්‍රශ්ණයකට පමණක් පිළිතුරු සපයන්න

අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩු කරනු ලැබේ

1. ප්‍රකාශිත භාරයක් බිහිවන්නේ තම අභිමුඛව හෝ තම මරණින් පසුව ප්‍රදායකයා ඔහුගේ හෝ ඇයගේ දේපල පිළිබඳව භාරයක් නිර්මාණය කිරීමට සිතාමතාම සහ සවිඥානිකව තීරණය කිරීමෙනි. භාර සාධන පත්‍රයක් අත්සන් කිරීමෙන් හෝ අන්තිම කැමති පත්‍රයක් ලියාතැබීමෙන් හෝ මෙය සාක්ෂාත් කර ගත හැකිවේ. භාරයක් නිර්මාණය කිරීමේ පාර්ශව කරුවන්ගේ චේතනාව ඔවුන්ගේ භාෂාවෙන් හෝ ක්‍රියාවෙන් පැහැදිලිව පෙන්විය යුතුය. ප්‍රකාශිත භාරයකදී වචන වල නිශ්චිතතාව, භාර දේපල පිළිබඳ නිශ්චිතතාව, අරමුණු පිළිබඳ නිශ්චිතතාව තිබිය යුතුය.

   <u>චේතනාව සහ දේපල පිළිබඳ නිශ්චිතතාව</u> ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. ඔබගේ පිළිතුර අදාල නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරෙන් තහවුරු කරන්න.

2. භාර ආඥා පනතේ 2 වන වගන්තියේ මූලිකාංග විවේචනාත්මකව විභාග කරමින් භාර ආඥා පනතට ඉංග්‍රීසි නීතියේ මූලධර්ම අදාල කර ගැනීම කෙරෙහි ශ්‍රී ලංකා අධිකරණයන්හි ආකල්ප නිසිපරිදි බලපා ඇතිද යන්න විස්තර කරන්න. අදාල නඩු තීරණ සහ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

- සියළුම හිමිකම් ඇවිරිණි -